# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1980 අංක 45 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1980 ඔක්තෝබර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව ශත 35 යි

# 1980 අංක 45 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 88/79.

**1971 අංක 47 දරන රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 45 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1971 අංක 47 දරන රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනතෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක—

(අ) "රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත" යන වචන; සහ

(ආ) "රාජ්‍ය චිත්‍රපට සංස්ථාව" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව" යන වචන

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් දැන්වීමක, නිවේදනයක, සාධන පත්‍රයක හෝ වෙනත් ලේඛනයක රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත සහ රාජ්‍ය චිත්‍රපට සංස්ථාව පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම, පිළිවෙළින්, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත සහ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව පිළිබඳ සඳහන් කිරීමක් ලෙස කියවනු ලැබිය යුතු ය: තේරුම් කරනු ලැබිය යුතු ය.

"රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත" සහ "රාජ්‍ය චිත්‍රපට සංස්ථාව" පිළිවෙළින් "ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනත" සහ "ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) සිනමා ශාලාවල සහ චිත්‍රාගාරවල අනුග්‍රාහකයන්ගේ සහ වැඩ කරන අයගේ පහසුව සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය, ප්‍රමාණවත් සේවා සහ පහසුකම් සිනමා ශාලා සහ චිත්‍රාගාර මඟින් සැලැස්වීම සහතික කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආආ) සිනමා ශාලා සහ චිත්‍රාගාර හෝ චිත්‍රපට කර්මාන්තයෙහි නිරත ආයතන පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ආආආ) සිනමා ශාලා පිහිටුවීම සහ ස්ථාපනය කිරීම පාලනය කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරයන් අතරින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයකු පත් කළ යුතු ය. සභාපතිවරයා සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—එ 50875—10,000 (80/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

21. සංස්ථාව විසින්, සංස්ථාවේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (අඅ) සිනමා ශාලාවල සහ චිත්‍රාගාරවල අනුග්‍රාහකයන්ගේ සහ වැඩ කරන අයගේ පහසුව සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය ප්‍රමාණයටත් පහසුකම් සිනමා ශාලා සහ චිත්‍රාගාර විසින් සපයනු ලැබීම ;

(අඅඅ) සිනමා ශාලා පිහිටුවීම සහ ස්ථාපනය කිරීම පාලනය කිරීම ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 63අ සහ 63ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63අ සහ 63ආ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

" මේ පනත යටතේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධානය මත කරනු ලබන ක්‍රියා සඳහා ආරක්ෂාව.

63අ. (1) (අ) සංස්ථාව විසින් සද්භාවයෙන් මේ පනත යටතේ කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන ලද ක්‍රියාවක් සඳහා සංස්ථාවට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලයේ විධානය මත සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාව විසින් දරන ලද වියදම් සංස්ථාවේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය. තව ද එවැනි සිවිල් හෝ අපරාධ නඩුවක දී

සංස්ථාවට ගෙවනා ලද හෝ සංස්ථාව විසින් අයකර ගන්නා ලද යම් ගාස්තු සංස්ථාවේ අරමුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධානය මත (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරනු ලැබුවේ යයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදම්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බව අධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ නම්, ඒ වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගනු ලැබ තිබේ නම් හැර, සංස්ථාවේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව පිට ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

63ආ. සංස්ථාවට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී සංස්ථාවේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව පිට ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.".